නල්ලූර් ප්‍රාදේශීය සභාව
යාපනය දිස්ත්‍රික්කය
----------------------

1 මූල්‍ය ප්‍රකාශන
-----------------

1.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
--------------------------------

2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2017 මාර්තු 24 දිනද, ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2016 මාර්තු 24 දිනද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර, 2016 වර්ෂයේ විගණකාධිපතිවරයාගේ වාර්තාව 2017 අගෝස්තු 31 දින සභාවේ ලේකම්ට යවා ඇත.

1.2 තත්ත්වාගණනය කළ මතය
-------------------------------

මෙම වාර්තාවේ 1.3 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශන වලින් 2016 දෙසැම්බර් 31 දිනට නල්ලූර් ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම
------------------------------------------

1.3.1 ගිණුම්කරණ ප්‍රතිපත්ති
-------------------------

සභාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී අනුගමනය කළ ගිණුම්කරණ ප්‍රතිපත්ති සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව්කර නොතිබුණි.

1.3.2 ගිණුම්කරණ අඩුපාඩු
---------------------------

පහත ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.
ප්‍රාදේශීය සභා සතු වාහන 02 ක් සභාවේ නමට අයිතිය පවරා ගෙන නොතිබුණු අතර, ඒවායේ වටිනාකම ගිණුම්වලට ගෙනවිත් නොතිබීමෙන් මෝටර් වාහනවල වටිනාකම් ගිණුම්වල අඩුවෙන් දක්වා තිබුණි.

1.3.3 ලැබිය යුතු ගිණුම්
------------------

අත්තිකාරම් වශයෙන් ගෙවන ලද රු. 206,437 ක් මුදලක් වසර 05 කට වඩා වැඩි කාලයක සිට නිරවුල් කර නොතිබුණි.

1.3.4 ලේඛන හා පොත්පත් නොපැවැත්වීම
-----------------------------------------------

සභාව විසින් මිනුම් ලේඛනය, දේපල විකුණුම් බදු ලේඛනය,විදුලි සම්බන්ධතා ලේඛනය යනාදී ලේඛන පවත්වා නොතිබුණි.

1.3.5 විගණනය සඳහා සාක්ෂි නොවීම
-----------------------------------

අවශ්‍ය සාක්ෂි නොතිබීම හේතුවෙන් රු. 148,246 ක් වටිනා ගනුදෙනු 02 ක් විගණනයේදී
සතුටුදායකව සන්නිරීක්ෂණය කිරීමට නොහැකිවිය.

1.3.6 නීති, රීති හා රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත දැක්වෙන අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති, රීති , හා රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1990 ඔක්තෝබර් 10 වන දිනැති අංක 41/90 දරන රාජ්‍ය පරිපාලන ස්වදේශ කටයුතු අමාත්‍යාංශයේ චක්‍රලේඛය | සභාව සතු වාහනවල ඉන්ධන පරිභෝජනය පිළිබඳ පරීක්ෂණ පවත්වා නොතිබුණි. |

2. මූල්‍ය සමාලෝචනය

2.1 මූල්‍ය ප්‍රතිඵලය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා සභාවේ ක්‍රියාකාරකම්වල ප්‍රතිඵලය පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 83,423,712 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම් ඉක්මවූ ආදායම රු. 64,903,029 ක් විය. මේ අනුව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු. 18,520,683 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණි.

2.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ සභාවේ මූල්‍ය ප්‍රතිඵලය ශුද්ධ අතිරික්තය රු. 351,314 ක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ශුද්ධ අතිරික්තය රු. 679,090 ක් විය. මෙය සමාලෝචිත වර්ෂයේ අවසාන මූල්‍ය ප්‍රතිඵලය රු. 327,776 කින් පහත වැටීමක් පෙන්නුම් කෙරිණි.

2.3 කාරක ප්‍රාග්ධන කළමනාකරණය

ඉදිරිපත්කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සභාවේ සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 321,447,826 ක් වී තිබූ අතර එයට අනුරූපීව ඉකුත් වර්ෂයේ කාරක ප්‍රාග්ධනය රු. 264,111,088 ක් වී තිබුණි. මේ අනුව සමාලෝචිත වර්ෂයේ කාරක ප්‍රාග්ධන රු. 57,336,738 කින් වර්ධනයක් පෙන්නුම් කෙරිණ.

2.4 ආදායම් පරිපාලනය

2.4.1 ආදායම් රැස්කිරීමේ කාර්‍යසාධනය

ලේකම් විසින් ඉදිරිපත් කර තිබූ පරිදි සමාලෝචිත වර්ෂය සඳහා ඇස්තමේන්තුගත ආදායම්, තථ්‍ය ආදායම් හා හිඟ ආදායම් පිළිබඳ තොරතුරු පහත දැක්වේ.

| ආදායම් විෂයය | 2016 ------ | | |
|---|---|---|---|
| | ඇස්තමේන්තුගත | තථ්‍ය | දෙසැම්බර් 31 දිනට සමුච්චිත හිඟය |
| | රු.000 | රු.000 | රු.000 |
| වරිපනම් හා බදු | 2,725 | 2,600 | 6,899 |
| බදු කුලී | 25,289 | 21,454 | 983 |
| බලපත්‍ර ගාස්තු | 2,826 | 3,450 | - |
| වෙනත් ආදායම් | 110,002 | 125,898 | 192,878 |
| එකතුව | 140,842 | 153,402 | 200,760 |

2.4.2 වරිපනම් බදු

රු. 5,915,521 ක වරිපනම් බදු මෙතෙක් අය නොකර හිඟව තිබුණි.

2.4.3 බදු සහ කුලි

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 146,916 ක කඩබදු අයනොවී හිඟව තිබුණි.

(ආ) පොළ කඩ කාමර බදු රු. 577,074 ක් මෙතෙක් සභාව විසින් අයකරගෙන නොතිබුණි.

2.4.4 උසාවි දඩ මුදල් හා මුද්දර ගාස්තු

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ මාස 03 ක උසාවි දඩ මුදල් රු. 965,000 ක් සභාව විසින් අයකර නොතිබුණි.

(ආ) සමාලෝචිත වර්ෂය සහ ඉකුත් වර්ෂයට අදාලව ඉඩම් රෙජිස්ට්‍රාර් ජනරාල් වරයාගෙන් ලැබිය යුතු රු. 142,049,877 ක මුද්දර ගාස්තු අයකර ගෙන නොතිබුණි.

3 මෙහෙයුම් සමාලෝචනය

3.1 කළමනාකරණ අකාර්යක්ෂමතා

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) අනවසර සන්නිවේදන කුළුනු 03 ක් ඉදිකිරීම සම්බන්ධයෙන් සභාව විසින් කටයුතු කර නොතිබුණි.

(ආ) සභාවේ ක්‍රියාකාරකම් කායීක්ෂමතාව පවත්වා ගෙන යාම සඳහා වාර්ෂික විගණන කළමනාකරණ කමිටු රැස්වීම 04 ක් පැවැත්විය යුතුය. එසේ වුවද, සමාලෝචිත වර්ෂයේ විගණන කළමනාකරණ කමිටු රුස්වීම් 02 ක් පමණක් පවත්වා තිබුණි.

(ඇ) සභාවේ අනුමත සේවක සංඛ්‍යාව 136 ක් වුවද තත්‍ය සේවක සංඛ්‍යාව 117 කි.ඒ අනුව සේවක පුරප්පාඩු 06 ක් විය.

3.2 ඌණ උපයෝජිත වත්කම්

-----------------------------

පහත නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) රු. 5,354,000 ක් වටිනා ඉඩම් වර්ෂ 03 ක කාලයක සිට නිෂ්ක්‍රියව තිබුණි.

(ආ) රු. 823,060 ක් වටිනා ග්‍රාමීය පොල ප්‍රයෝජනයට ගෙන නොතිබුණි.

3.3 කොන්ත්‍රාත් පරිපාලනය

---------------------------

අයවැය ලේඛනය අනුව සැලසුම් කරනලද රු. 23,610,000 ක් වටිනා ප්‍රාග්ධන වැඩ 11 ක් සම්පූර්ණයෙන් ක්‍රියාත්මක කර නොතිබුණි.

4 ගිණුම් කටයුතු භාවය හා යහපාලනය

---------------------------------------

4.1 අයවැය පාලනය

-----------------

වියදම් ව්‍යුහය

---------------

අයවැය ගත වියදම් සහ තත්‍ය වියදම් අතර රු. 174,875 සිට රු. 7,111,107 දක්වා වියදම් විචලනයක් විගණනයේදී නිරීක්ෂණය විය.